**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය - 2019**

**------------------------------------------------------------------------------------------**

**1.1 මතය**

**------**

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍යය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා නියමාවලියේ 16 (1) ඡේදය | 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වර්ෂ 11 වෙනුවෙන් අධ්‍යක්ෂ ධූරය සඳහා පූර්ණ කාලීන අධ්‍යක්ෂවරයෙකු පත්කර නොතිබූ අතර එම කාලපරිච්ඡේදය තුළ වැඩබැලීමේ පදනම මත සේවය කර තිබූ අධ්‍යක්ෂවරුන් වෙනුවෙන් රු.3,074,812 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. මෙම තනතුර සඳහා පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙකු පත්නොකිරීම ආයතනයේ කාර්යසාධන ඉලක්ක ලඟා කර ගැනීමේදී අහිතකර ලෙස බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ධූරය සඳහා අධ්‍යක්ෂවරුන් රිජන්ට් කවුන්සිලයේ නිර්දේශ මත පත්කිරීමේ බලධාරියා වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලබයි. එමෙන්ම වැඩබැලීමේ පදනම මත සේවය කර තිබූ අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණ දීමනා ඒ සඳහා ඇති චක්‍රලේඛන අනුව ගෙවීම් කටයුතු සිදුකර ඇත. | නියමාවලියේ වගන්ති ප්‍රකාරව පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙකු පත්කර මධ්‍යස්ථානයේ කාර්යසාධන ඉලක්ක ලඟා කර ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,803,096 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.111,357,311 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.91,554,215 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආචාර්ය උපාධි ප්‍රදාන සහ දර්ශනපති ප්‍රදාන සඳහා දරන ලද වියදම පහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය විසින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ඇපයෙන් සීමිත සමාගමක් ලෙස 2015 ජූලි 07 දින සිට ක්‍රියාත්මක වන පරිදි NCAS Campus නමින් ආයතනයක් පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. එසේ තීරණය කර සමාලෝචිත වර්ෂය වනවිට වසර 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද එහි කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | 2015 වර්ෂයේදී සිදු වූ දේශපාලන වෙනස්වීමත් සමග NCAS Campus ආයතනයේ වැඩ කටයුතු ඉදිරියට සිදුකිරීමට නොහැකි විය. එමෙන්ම පැවති කළමනාකරණ කමිටුව විසින් ද NCAS Campus ආයතනයේ වැඩ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක නොකරන බවට තීරණය කර 2020 ජනවාරි මස සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත නීත්‍යානුකූල ලේඛන භාර දෙමින් NCAS Campus ආයතනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් සිදුකර ඇත. | මධ්‍යස්ථානය යටතේ ආයතන ස්ථාපිත කිරීමේදී එම ආයතනවලට අදාළ අරමුණු හා ඉදිරි ක්‍රියාකාරීත්වය නිශ්චිතව හඳුනාගෙන ආයනත පිහිටුවීමට කටයුතු කළ යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයක දර්ශනපති හා දර්ශනශූරි උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ආයතනයේ සේවය කරන කළමනාකරුවෙකු වෙත 2015 ජනවාරි මාසයේ රු.600,000 ක මුදලක් නිදහස් කර එම මාසයේ සිට 2017 වර්ෂය අවසානය දක්වා අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | ආයතනයේ සේවය කරන කළමනාකරුවෙකු විසින් සතියකට දින 2 1/2 බැගින් හා 2015 වර්ෂයම අධ්‍යයන නිවාඩු ලබා ගෙන ඇති නමුත් 2016 හා 2017 වර්ෂවලදී එසේ නිවාඩු ලබා ගෙන නොමැත. එමෙන්ම ඔහු 2016.07.10 දින දක්වා ඔහුගේ අධ්‍යයන කටයුතුවල ප්‍රගති වාර්තා ආයතනය වෙත ලබා දී ඇත. | ප්‍රදාන හා අධ්‍යයන නිවාඩු ලබාගත් නිළධාරියා අදාළ පාඨමාලාව සම්පූර්ණ නොකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග මධ්‍යස්ථානය විසින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා දර්ශනශූරි හා දර්ශනපති උපාධි ප්‍රදාන රු.172,112,189 ක් ලබා දී තිබූ ප්‍රදානලාභීන් 90 දෙනෙකු විසින් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අධ්‍යයන කටයුතු නිමකර නොතිබුණි. | 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා උපාධි සම්පූර්ණ නොකළ ප්‍රදානලාභීන් 18 දෙනෙකුගෙන් 11 දෙනෙකු ඔවුන්ගේ නිබන්ධන විශ්වවිද්‍යාල වෙත භාර දී ඇති අතර ප්‍රදානලාභීන් 02 දෙනෙකු සම්බන්ධව විශ්වවිද්‍යාල මඟින් නීති මාර්ගයෙන් කටයුතු කර ඇත. ඉතිරි ප්‍රදානලාභීන්ගේ ඉල්ලීම් සම්බන්ධව කළමනාකරණ කමිටුව ඉදිරියේදී තීරණය කිරීමට නියමිතව ඇති අතර කිසිදු ප්‍රතිචාරයක් නොමැති ප්‍රදානලාභීන් පිළිබඳව එක් එක් විශ්වවිද්‍යාල අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ප්‍රදාන ලබාගෙන ඇති ප්‍රදානලාභීන් 72 කගේ උපාධි සම්පූර්ණ කිරීම සඳහා වසර 06 ක පමණ කාලයක් ගත වන බැවින් අදාළ ප්‍රමාදයන් පිළිබඳව 2019 වසරේ පැවති කළමනාකරණ සභාව විසින් තීරණයක් ගෙන නොමැත. | ප්‍රදාන ලබා දී ඇති ප්‍රදානලාභීන් අදාළ අධ්‍යයන කටයුතු කර ගෙන යාම සම්බන්ධව වරින්වර ඒ ඒ උසස් අධ්‍යාපන ආයතනය හරහා පසුවිපරම් කටයුතු සිදුකිරීමට මධ්‍යස්ථානය වගබලා ගත යුතු අතර උපාධි සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (iii) | කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පරිගණක අධ්‍යාපන ආයතනයේ සේවය කරන ලද අධ්‍යක්ෂවරයෙකුට සහ සිසුන් දෙදෙනෙකුට ඔවුන්ගේ දර්ශනපති උපාධි සම්පූර්ණ කිරීම සඳහා 2014 නොවැම්බර් 04 දින රු.800,000 ක මුදලක් ප්‍රදාන ලෙස ලබා දී තිබුණ ද එම ප්‍රදානයන්ට අදාළ අධ්‍යයන කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි. | UCSC ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ සිසුන් දෙදෙනෙකු විසින් එම ආයතනය මඟින් සිදුකරනු ලැබූ යන පර්යේෂණය සඳහා එම ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් ජාතික මධ්‍යස්ථානයෙන් ප්‍රදානයක් සඳහා ඉල්ලුම් කොට තිබුණි. කළමනාකරණ සභාවේ අනුමැතිය මත ලබා දී ඇති අතර අධ්‍යයන කටයුතු කරගෙන යන බවට වූ එක් ප්‍රගති වාර්තාවක් ආයතනයට ඉදිරිපත් කර ඇත. එමෙන්ම එහි ඉදිරි කටයුතු විමසමින් අප විසින් සිහිකැඳවීම් ලිපි [illegible] ආයතනය වෙත යොමු කර ඇත. | දර්ශනපති උපාධි ප්‍රදාන ලබාගත් උපාධිධාරීන් අදාළ පාඨමාලාව නියමිත දිනට සම්පූර්ණ කරනු ලබන බවට මධ්‍යස්ථානය විසින් පසුවිපරම් කළ යුතුය. |
| (iv) | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව දර්ශනපති උපාධිය හා දර්ශනශූරි උපාධිය හැදෑරීම සඳහා දැනටමත් ප්‍රදාන ලබා ගෙන ඇති ප්‍රදානලාභීන් 50 දෙනෙකුට සහ නව | NCAS ආයතනය මඟින් වර්ෂයට දෙවතාවක් NCAS ප්‍රදානය සහ Queensland University of Technology (QUT) - NCAS | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඇතුළත් කිරීමේදී මධ්‍යස්ථානයට ලබා |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදානලාභීන් 40 දෙනෙකුට ප්‍රදාන ලබාදීම සඳහා ප්‍රදාන ලබාදීම පිළිවෙළින් රු. මිලියන 45 ක් හා රු.මිලියන 18.2 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී දැනටමත් ප්‍රදාන ලබා ගෙන ඇති පශ්චාත් උපාධිලාභීන් 27 දෙනෙකු වෙත රු.මිලියන 33 ක් හා නව ප්‍රදානලාභීන් 8 දෙනෙකු වෙත රු.මිලියන 14.3 ක් පමණක් ප්‍රදාන ලෙස ලබා දී තිබුණි. | ශිෂ්‍යත්ව ප්‍රදාන ලබා දුන්න ද 2019 වර්ෂයේදී පැවති මූල්‍ය අපහසුතා නිසා එක වටයකදී පමණක් ප්‍රදාන ලබාදීමට සිදුවිය. එහිදී ප්‍රදානලාභීන් 11 දෙනෙකු තෝරා ගත් අතර එම තෝරා ගත් පිරිසෙන් අවම සුදුසුකම් සපුරා තිබූ 08 දෙනෙකුට ප්‍රදාන ලබා දෙන ලදී. ඉතිරි ප්‍රදානලාභීන් විසින් අවශ්‍ය අවම සුදුසුකම් සැපිරීමෙන් පසු සහ අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සිදුකිරීමට නියමිතය. එබැවින් ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කොට ඒ සඳහා කළමනාකරණ කමිටුවෙහි අනුමැතිය ලබා ගෙන ඇත. | කර ගත හැකි ඉලක්ක ඇතුළත් කිරීමටත් එම ඉලක්ක ලබා කර ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (v) | පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වෙනත් ආයතන සමග ගිවිසුම් ඇති කර ගැනීම යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යංශය සහ Queensland University of Technology Brisbane – Australia යන ආයතනය සමග 2013 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 05 ක කාලපරිච්ඡේදයකට අදාළව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව වර්ෂයකට පශ්චාත් උපාධිධාරීන් 06 දෙනෙකු බැගින් වර්ෂ 06 ක් තුළ උපාධිධාරීන් 36 දෙනෙකු වෙත පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රදාන ලබා දිය යුතුව තිබුණි. එසේ වුවද 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ප්‍රදානලාභීන් 22 දෙදෙනෙකු වෙත පමණක් ප්‍රදාන ලබාදී තිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රදානලාභීන් 14 දෙනෙකු වෙත ප්‍රදාන ලබා දීමට අවස්ථාව අහිමි වී තිබුණි. එසේම පශ්චාත් උපාධි ප්‍රදාන ලබාදීමේ අරමුණින් බාහිර ආයතන සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹීමේ අවශ්‍යතාවය පැවතිය ද 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් ආයතනයක් සමග පමණක් ගිවිසුමකට එළඹ තිබුණි. | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වසර 05 ක කාලය තුළ තෝරා ගත් ප්‍රදානලාභීන් 28 දෙනෙකු අතරින් නිර්දේශිත සුදුසුකම් සපුරා තිබූ ප්‍රදානලාභීන් 26 දෙනෙකු වෙත ප්‍රදාන ලබාදීම සිදුකරන ලදී. අයදුම්කරුවන් විසින් අනිවාර්යයයෙන්ම ලබා ගත යුතු IELTS සාමාර්ථ හා වෙනත් හේතු මත ඇතැම් වර්ෂයන්හි ප්‍රදාන ලබා දීමට නොහැකි විය. 2019 වර්ෂයේ පැවති මූල්‍ය අපහසුතා නිසා QUT ප්‍රදාන ලබා නොදුන් අතර එය සංශෝධිත ක්‍රියාකාරි සැලැස්මෙහි දක්වා ඒ සඳහා කළමනාකරණ කමිටුවෙහි අනුමැතිය ලබා ගෙන ඇත. | පශ්චාත් උපාධි ප්‍රදාන ලබාදීමේ අරමුණින් බාහිර ආයතන සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹීමේ අවස්ථා තවදුරටත් වැඩිකර ගැනීමටත් එසේ එළඹෙන ගිවිසුම්වලට අනුව ප්‍රදාන ලබාදීමටත් මධ්‍යස්ථානය විසින් කටයුතු මෙහෙයවිය යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වත්කම් වැඩිදියුණු කිරීම සහ පුනරුත්ථාපනය සඳහා ලබාදී තිබූ රු.1,250,000 ක් සහ ජාතික මධ්‍යස්ථානයේ පර්යේෂණ ඇතුළත් ග්‍රන්ථ වෙනුවෙන් (NCAS ප්‍රකාශන) ලබාදී තිබූ රු.300,000 ක මුදලක් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | අදාල පුනරුත්ථාපන කටයුතු 2020 වර්ෂය තුල සිදු කිරීමට කටයුතු කරමි. ප්‍රකාශන සඳහා ලබා දී ඇති රු.300,000ක මුදල ලබා දීම සඳහා අවශ්‍ය අයදුම්පත් කැදවීමට කටයුතු කලද කිසිදු අයදුම්පතක් ලැබී නොමැති අතර එබැවින් වරින් වර අයදුම්පත් කැදවීමේ අවසාන දිනය කල් දැමීමට කටයුතු කර ඇත. | මධ්‍යස්ථානයේ අරමුදල් ලබා දී ඇති අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ දර්ශනපති උපාධිධාරීන් ප්‍රමාණය ඉහළ දැමීම අරමුණ ඇතිව මධ්‍යස්ථානය සඳහා 2019 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය 280 ක් වෙනුවෙන් වැඩමුළු 13 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද වැඩමුළු 07 ක් පමණක් පවත්වා තිබුණි. එසේම ඒ සඳහා සහභාගී වී තිබූ නිලධාරීන් සංඛ්‍යාව 88 දෙනෙකු පමණක් වී තිබුණු අතර ඒ අතරින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් සහභාගී වී තිබූ නිලධාරීන් සංඛ්‍යාව 52 දෙනෙකු පමණක් විය. | 2019 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම අනුව අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු 08 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. නමුත් 2019 වර්ෂයේදී වැඩමුළු 09 ක් සම්පූර්ණ කිරීමට හැකි වී ඇත. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු මෙහෙයවිය යුතුය. |
| (ii) | ක්‍රියාකාරී සැලැස්මේ විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලන හා අනධ්‍යාන කාර්යය මණ්ඩලයේ ධාරිතා වර්ධනය කිරීම යටතේ පුහුණු වැඩසටහන් 4 ක් මඟින් නිලධාරීන් 100 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී එම පුහුණු වැඩසටහන් කිසිවක් පවත්වා නොතිබීම නිසා එම පුහුණු වැඩසටහන් වලට අදාළ අරමුණු ඉටු කරගෙන නොතිබුණි. | අයදුම්පත් කැඳවා තෝරා ගන්නා ලද සම්පත් දායකයන් සම්බන්ධ කර ගනිමින් පාඨමාලා සිදුකරන ලෙස කළමනාකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. නමුත් ඒ ආකාරයට අයදුම්පත් කැඳවුවද, සුදුසු සම්පත් දායකයන් තෝරා ගැනීමට නොහැකි වූ බැවින් එම පාඨමාලා පැවැත්වීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටු කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |